වැල්වෙටිතුරෙයි නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය
---------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 30 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට වැල්වෙටිතුරෙයි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ඌනතා

(i.) මූල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ඌනතා වත්කම්, බැරකම් හා වියදම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| | වත්කම් | | බැරකම් | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම<br>රු. | අවස්ථා ගණන | වටිනාකම<br>රු. | අවස්ථා ගණන | වටිනාකම<br>රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 23,000,000 | - | - | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | 02 | 209,317 | 01 | 34,489 |

(ii.) සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි 18 වටිනාකම තක්සේරු කොට මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කර නොතිබිම නිසා වත්කම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරිම

අවශ්‍ය තොරතුරු නොමැතිකම නිසා රු.202,500 ක් සඳහා වූ ගණුදෙනු විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| නගර සභා ආඥා පනත පරිච්ඡේදය 255<br>76(1) වගන්තිය, 77 | - | අනුමැතියකින් තොර ඉදිකිරිම් 26 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| පරිච්ඡේදය 255<br>159(1) වගන්තිය | - | රෙගුලාසි වලට පටහැනිව නව ගොඩනැගිල්ලේ සමාරම්භක වියදම් වශයෙන් රු.74,330 ක් දරා තිබුණි. |
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | - | සමාලෝචිත වර්ෂය තුලදි අයකරන ලද එකතු කළ අගය මත බදු රු.2,600 ක් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,366,328 ක් වූ අතර ඊට අනුරූපි ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.951,768 ක් විය.

2.2 මුල්‍ය පාලනය

අයවැය විධිමත්ව සකස් කර නොතිබු බැවින් අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර රු.14,838 ක වෙනස් ද අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.8,797,211 වෙනසක් ද විගණනයේදි නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම්

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 790 | 772 | 4,545 |
| බදු කුලී | 2,495 | 2,518 | 5 |
| බලපත්‍ර ගාස්තු | 484 | 1,124 | - |
| වෙනත් ආදායම් | 27,330 | 26,670 | 13,204 |

2.3.2 උසාවි දඩ මුදල්

2012 සහ 2013 වර්ෂ සඳහා රු.7,095,684 ක් වු උසාවි දඩ මුදල් මහේස්ත්‍රාත් උසාවියෙන් ලබා ගැනිම සඳහා ඵලදායි ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

2012 හා 2013 වර්ෂ සඳහා රු.6,107,958 ක් වු රෙජිස්ට්‍රාර් ජනරාල් ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් සහ ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර තිබුණි. එනමුත් ඒවා අයකර ගැනිම සඳහා ඵලදායි ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.4 හිඟ තක්සේරු බදු

(i.) අවුරුදු 10 වැඩි කාලයක් තුල තක්සේරු බදු යලි ඇගයීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව නව ගොඩනැගිලි සඳහා වු තක්සේරු බදු අඩුව ඇති බැව් පෙනි ගියේය.

(ii.) සමාලෝචිත වර්ෂය සඳහා දක්වා තිබු තක්සේරු බද්ද රු.654,919 ක් විය. එනමුත් කොට්ඨාශ අංක 9 සඳහා අයකර ගැනිමට තිබු තක්සේරු බද්ද රු.4,544,635 ක් විය. හිඟ මුදල් අයකර ගැනිම සඳහා ඵලදායි ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

උපයෝජනය නොකළ භෞතික සම්පත්

පසුගිය වසර තුල දි සභාවේ වාහන 4 ක් නිශ්කාර්යව තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

2.5.1 අත්හැර දමන ලද ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය සඳහා වු අයවැය ප්‍රකාශයෙහි දක්වා තිබු රු.100,000 ක වටිනාකමින් මාන්නන්ගල්, කතිහවරායර් කෝවිලේ මහජන ළිඳ වටා තාප්පයක් ඉදි කිරිම සිදුකර නොතිබුණි.

2.5.2 කොටස් පමණක් නිමකළ ව්‍යාපෘති

--------------------------------------------

වටිනාකම රු.3,175,000 ක් වූ ව්‍යාපෘති 6 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර නොතිබුණි. වසරේ කෙළවර ආරම්භ කළ වැඩ සඳහා වූ මුදල් විවිධ ණයගැති ගිණුමේ පෙන්නුම් කර තිබුණි.

2.5.3 නිම නොකර අත්හැර දැමූ ව්‍යාපෘති

-------------------------------------------

(i.) මායිලිර්ඉරනායි සුසාන භූමියේ රු.400,000 ක වටිනාකමට තාප්පයක් ඉදිකිරිම ඉකුත් වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මහජන විරෝධය හේතුවෙන් රු.58,046 ක මුදලක් වැය කිරිමෙන් පසු කර්මාන්තය අත්හිටුවා තිබුණි.

(ii.) වාඩි පටුමගෙහි කාණු පද්ධතිය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,000,000 ක මුදලක් වෙන්කර තිබුණි. ඒ සඳහා රු.322,592 ක් වැයකර තිබු නමුත් සිවන් කෝවිලේ භාරකරු විසින් සිදුකරන ලද විරෝධතා හේතුවෙන් කර්මාන්තය අත්හිටුවා තිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(i.) වාහන උපයෝජනය
(ii.) අයවැය
(iii.) ආදායම් එකතු කිරිම
(iv.) විවිධ ණයගැතියෝ